## අන්තර්පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරගය
### උපදෙස් පත්‍රිකාව

---

## ආගමික කටයුතු කුසලතා තරගය

මෙම තරගය පූර්ව ප්‍රාථමික, ප්‍රාථමික, කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ යන අංශ හතර සඳහා ම පැවැත්වේ. විනිශ්චය මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන ආගමික කටයුත්තක් සම්ප්‍රදායානුකූලව ඉදිරිපත් කළ යුතු ය.

1.4. අරමුණු

1.4.1. ශාසනික උරුමයන් ශ්‍රවණ ප්‍රසාදය වැඩිවන අයුරින් නිවැරදිව හා අවබෝධයෙන් ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශාසනික ව්‍යවහාර කුසලතාව දියුණු කිරීම.

1.4.2. පරිපාටිගත පිළිවෙළ හා සම්ප්‍රදාය උල්ලංඝනය නොකොට ශාසන ගෞරවයෙන් ආගමික කටයුතු කිරීමේ හා කරවීමේ හැකියාව දියුණු කිරීම.

1.5. තරග කොන්දේසි

1.5.1. එම අවස්ථාවේ දී විනිශ්චය මණ්ඩලය මඟින් නියම කරනු ලබන ඉදිරිපත් කිරීමක් කළ යුතු ය.

1.5.2. එක් තරගකරුවෙකුට විනාඩි 07ක කාලයක් හිමි වේ.

1.5.3. පරිපාටිගත පිළිවෙළ හා සම්ප්‍රදාය අනුව අදාළ ඉදිරිපත් කිරීම කළ යුතු ය.

1.5.4. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

1.5.5. ජාතික මට්ටම දක්වා ම පහත සේවා යටතේ අදා ඉදිරිපත් කිරීම කිරීමට තරගකරුවන් සිදු වේ.

1. තිසරණ පන්සිල් පිහිටුවීම
2. අෂ්ටාංග උපෝසථ සීලයෙහි පිහිටුවීම
3. වන්දනා ගාථා නිවැරදිව පිළිවෙළට කියවීම
4. බුද්ධ පූජාව පැවැත්වීම (කවියෙන් පූජාව පැවැත්වීමට ලකුණු හිමි නොවේ)
5. බුද්ධ වන්දනා කරවීම (කවියෙන් පූජාව පැවැත්වීමට ලකුණු හිමි නොවේ)
6. පිං වාක්‍යය කියවීම
7. දානය, ගිලන්පස හා මතක වස්ත්‍ර පූජා කිරීම
8. පිරිත් ආරාධනා කිරීමේ ගාථා කියවීම

1.6. ලකුණු ලබාදීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| 1. | පරිපාටිගත පිළිවෙළ නොබිඳීම | - 10 |
| 2. | පැරණි සම්ප්‍රදායය සුරැකීම | - 10 |
| 3. | අක්ෂර හා වචන උච්චාරණය | - 10 |
| 4. | ශ්‍රව්‍ය මාධූර්යය | - 10 |
| 5. | ශ්‍රමණ සංස්කෘතියෙන් ඉදිරිපත් කිරීම | - 10 |
| | මුළු ලකුණු | 50 |